**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිසම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිසමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිසම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කිරීම අවසන් වී ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.3,636,467 ක් වූ වත්කම් ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇති වී තිබුණු ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි | පාලක මණ්ඩල තීරණ අංක 1035.04.02 අනුව 2022 ජනවාරි 01 දින සිට වත්කම් වල ජීව කාලය සංශෝධනය කර ඇත. එය සමාලෝචිත වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කර ඇත. මෙහි ඵලදායි ජීවිත කාලය සංශෝධනයේ දී, වත්කම් පන්ති වල සාමාන්‍ය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන ඇත. ප්‍රායෝගිකව ගණනය කිරීම් සිදු කිරීමේ දී වත්කම් පන්තිය තුල, සම්පූර්ණ ක්ෂය වූ වත්කම් ද පැවතිය හැක. එම වත්කම් ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයෙන් බැහැරව පිරිවැය අගය රු.194,000 ක් වූ භාවිතයෙන් ඉවත්කර තිබූ පරිගණක හා උපාංග සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය සඳහා සලකා බලා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.19,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2023 වර්ෂයේ ආරම්භක ශේෂයන් නැවත සකස් කර ඉදිරිපත් කරනු ඇත. | ගණනය කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 07 ඡේදය ප්‍රකාරව මෘදුකාංග අදාල දෘඩාංගයේ අනිවාර්ය අංගයක් නොවන විට, | 2023 වර්ෂයට අදාල ගිණුම් සකස් කිරීමේ දී අස්පෘශ්‍ය වත්කම් වෙනම මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු වුවත් රු.162,964 ක් වටිනා මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | | යුතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| පාසල් වෙත නව නිපැයුම් කව සඳහා මූල්‍යාධාර ලබා දීම. | 4,845,000 | ලැබීම් කුවිතාන්සි | මූල්‍යාධාර පාසල වෙත ලැබුණු බව සනාථ කිරීම සඳහා විධිමත් කුවිතාන්සියක් පාසල විසින් කොමිසම වෙත ලැබී නොතිබුණු බවට ඔබ කල නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී එය නිවැරදි කරගැනීමට කටයුතු කරනු ඇත. | වියදම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ටවුචරය සමඟ අමුණා තැබිය යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 වර්ෂයට පෙර සිට නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් ලබා දී තිබූ එකතු වටිනාකම රු.9,117,682 ක මුදලක් අයවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු.843,924 ක් වූ නිරවුල් නොවූ ණය හිමි ශේෂය නිරවුල් කිරීමට | මහවැලි අධිකාරිය සමඟ තිබූ රැස්වීම් වල සාකච්ඡා අනුව රු.761,524 ක් වූ මුදල තෝඩා ගොවිපලේ වැඩ සඳහා යොදා ගන්නා ලෙස නියම කර ඇත. පාලක මණ්ඩල තීරණ අනුව රු. 72,400 ක මුදල මහවැලි අධිකාරියට ගෙවීමෙන් පසු නැනෝ විෂන් | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කටයුතු කර නොතිබුණි. | ආයතනය වෙත ගෙවීම් කිරීමට තීරණය කර ඇති අතර ඒ සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ගයක් ඉදිරියේ දී ගනු ඇත.<br>රු. 10,000 ක් වටිනා අංක 539398 දරන චෙක්පත ඉතා ඉක්මණින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 138 (6) හා (8) | රෙගුලාසි වලින් බැහැර අසම්පූර්ණ වවුචර් සඳහා රු.720,000 ක් වටිනා චෙක්පත් 72 ක් ලියා අදාල දායකයාට බාර දීමෙන් තොරව රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී බිල්පත් වල ඒකක ප්‍රමාණය සහ වටිනාකම සඳහන් විධිමත් බිල්පත් ලබා ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව | රෙගුලාසියෙන් බැහැරව කොමිසමේ මාණ්ඩලික තත්වයේ නොවන නිලධාරීන්ට ද අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | ඔබගේ නිර්දේශය පරිදි ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 780 (1) | කොමිසමේ නිලධාරීන් විසින් විදුලි වැට බාරදීමේ කටයුතු, YIELD වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යාම වෙනුවෙන් වායු සමනය කල කාමර සහිත නවාතැන් ගාස්තු, නිලධාරී ආහාරපාන වියදම්, නිලධාරී දීමනා හා ඉන්ධන වියදම් සඳහා එකතුව රු.1,407,399 ක් වැයකර තිබුණි. | රට තුල පැවැති අධික උද්ධමන ආර්ථික තත්වය හේතුවෙන් භාණ්ඩ හා සේවාවන් හි මිළ ද අධික ලෙස ඉහල ගොස් ඇති වාතාවරණයක මෙම කටයුතු කරගෙන යාමට සිදුවීම නිසා සාපේක්ෂව වැඩි වියදමක් දරන්නට සිදුවූ බව ඔබගේ අවධානයට යොමු කරමි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට අනුව අරපිරිමැස්ම හා කාර්යක්ෂමතා වය පිළිබඳ සැලකිළිමත්ව කටයුතු කළ යුතුය. |
| (ඈ)ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ පළාත් 09 හි පැවති ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් සහභාගී වූ නිළධාරීන් 14 ක් වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවීම වෙනුවට නවාතැන් සඳහා රු.461,520 ක් සහ ආහාර | ආයතනය මඟින් අදාල ආහාර හා නවාතැන් පහසුකම්, එම නිළධාරීන්ට සපයන බැවින් අදාල නිළධාරීන්ට සංයුක්ත දීමනාව ගෙවනු නොලැබේ.<br>මෙම ගෙවීම් කිසිසේත් ආයතන සංග්‍රහයට පටහැනි නොවන බව ද කාරුණිකව අවධාරනය කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාන සඳහා රු.718,028 ක් වැය කර තිබුණි. | | |
| (ඉ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේකය | වසර 05 ඉක්ම වූ භාවිතයෙන් තොරව පවතින රු.568,000 ක් වටිනා වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කමිටුවේ නිර්දේශයන් මත අදාල ඉවත් කිරීම් සිදු කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ වලට අනුව කටයුතු කල යුතුය |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,992,449 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,433,824 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,426,273 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන සඳහා රජයේ දායකත්වය රු.9,030,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව සහසක් නිමැවුම් වැඩසටහන වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.998,450 ක් වියදම් දරා මුද්‍රණය කරන ලද ටී ෂර්ට් 1270 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් රු.320,280 ක් වටිනා ටී ෂර්ට් 408 ක තොගයක් ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණ නිවැරදි බව පිළිගන්නා අතර ඉදිරියේදී එම කරුණු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. ව්‍යාපෘති අංශයේ විවිධ වැඩසටහන් වල දී එම ටී ෂර්ට් තොගය ක්‍රමවත්ව බෙදාහැරීමට කටයුතු කරමින් පවතී. | රජයේ වියදම් දැරීමේදී කාර්යක්ෂමව සහ ඵලදායී වන ලෙස කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී YIELD හා පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැය කර ඇති මුළු පිරිවැය රු.3,254,791 කි. ඉන් වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිසට ආහාරපාන ලබා දීමට , සහභාගී වූ කොමිසමේ නිලධාරීන්ට ආහාරපාන හා නවාතැන් පහසුකම් ලබා දීමට, වැනි අරමුණට ඍජුව බලනොපාන කාර්යන් සඳහා මුළු වියදමින් සියයට 81 වැය කර තිබුණි . | YIELD 3D Innovation Competition හි පුහුණු වැඩසටහන් සඳහා කොමිසම අදාල සංවිධාන කටයුතු සිදුකරන ලද අතර ඒ වෙනුවෙන් සම්පත් දායකත්වයන් Panacea Solutions ආයතනය මගින් නොමිලේ සපයාගැනීමට කොමිසමට හැකිවිය. ඒ වෙනුවෙන් වූ ආහාරපාන ලබාදීම්, නවාතැන් පහසුකම් සැපයීම් අදාල ව්‍යාපෘතියේම කොටස් ලෙස සළකා ව්‍යාපෘතීන් සැලසුම් කරන ලද අතර එම වැඩසටහන් මාලාව | රාජකාරි ඉටු කිරීමේදි කාර්යක්ෂම හා ඵලදායිව නියමිත කාල රාමුව තුල ඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සාර්ථකව කරගෙන යාම සඳහා එම කාර්යයන් අත්‍යාවශ්‍ය විය. ඒ අනුව එම ව්‍යාපෘතීන් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී එම වියදම් කාණ්ඩයන් ද ඇතුලත්ව එම ඇස්තමේන්තු සකස් කරනු ලැබූ බැවින් ව්‍යාපෘතියෙහි අරමුණුගත කාර්යයන් වෙනුවෙන් අදාල වියදම් දරා ඇත. | |
| (ඇ) කළමනාකරණ මණ්ඩල තීරණ අංක 1002.01.07 ප්‍රකාරව අළුතින් ලියාපදිංචි කරන ලද නව නිපැයුම් කව සඳහා මූල්‍යාධාර ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණු නමුත් 2019 වසරේ සිට ලැබී තිබුණු අයදුම්පත් 595 ක ප්‍රමාණ නිසිලෙස අධ්‍යයනය කර එම පාසල් ලියාපදිංචි කර පාසලේ නම, ලිපිනය ගිණුම් අංකය, විදුහල්පති, සම්බන්ධීකාරකගේ දුරකථන අංකය ආදී නිවැරදි තොරතුරු ඇතුලත් කර සකසන ලද ලේඛනගත හෝ පරිගණක ගත දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. | ගිණුම් අංක හා යාවත්කාලීන කරන ලද වැඩි විස්තර ඉදිරියේ දී එම දත්ත ගොනුවට ඇතළත් කිරීමට නියමිතය. | දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නව නිපැයුම් කව පිහිටුවීම හා ඒවා අධීක්ෂණය කිරීම සඳහා කොමිසම විසින් රු.1,800,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඒ තුළින් 2022 වර්ෂයේ කොමිසමේ අරමුණ වී තිබුණේ කව 70 ක් අළුතින් පිහිටුවීම හා ජාතික මට්ටමේ තරඟ සඳහා නව නිමැවුම් 80 ක් ඉදිරිපත් කිරීමයි. 2022 සහසක් නිමැවුම් ජාතික තරඟය 2023 මැයි 31 වන විටත් පවත්වා නොතිබුණු අතර 2019 සිට 2023 දක්වා වසර 04 ක කාලච්ඡේදය තුළ විශ්වවිද්‍යාල තුළ පිහිටුවා ඇති මුළු කව ප්‍රමාණය 06 කි. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිලාභය වූ තරුණ ප්‍රජාව අතර නව | 2022 වර්ෂයේ පාසල් නව නිපැයුම් සමාජ 132 පිහුටුවා ඇති අතර විශ්ව විද්‍යාල නව නිපැයුම් සමාජ 5ක් පිහිටුවා ඇත.<br>2020 මාර්තු මස සිට පැවති කොරෝනා වසංගතය සහ පාසල් පද්ධතිය තුල විටින් විට ඇති වූ අර්බුධකාරී වාතාවරණය හා රටේ උද්ගතවුනු ආර්ථික අර්බුද හේතුවෙන් අපේක්ෂිත ආකාරයට විශ්ව විද්‍යාල තුල නව නිපැයුම්කරණයට උනන්දුවක් ඇති කරමින් අවශ්‍ය සහයෝගය ඔවුන් වෙතින් ලබාගැනීමට අපහසු විය. ඉදිරියේදී කොමිසම වෙතින් නව නිපැයුම් සමාජ වඩාත් ක්‍රමවත්ව විශ්ව විද්‍යාල පද්ධතිය තුල බිහි කිරීමට කටයුතු කරනු ඇත. සුදුසු වාණිජකරන අවස්ථා සඳහා ඒවා යොමු කිරීමට ද කොමිසම කටයුතු කරනු ඇත. | වාර්ෂිකව සැලසුම් කළ කටයුතු නියමිත කාලරාමුව තුල අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| නිපැයුම් සංස්කෘතියක් ඇති කිරීම හා රටතුළ ආයෝජන අවස්ථා ලබාදීම යන ප්‍රතිලාභ ලබාගැනීම කොමිසම අපොහොසත් වී තිබුණි. | | |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි ශේෂය රු.12,837,184 ක් වූ අතර මෙම ගිණුම 2022 වර්ෂය තුලදී නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | නව නිපැයුම්කරුවන් සඳහා ණය ආධාර ලබා දීම විධිමත් කිරීමේ අරමුණින් ඔවුන් බැංකු පද්ධතිය වෙත යොමු කර ඇති අතර, අප විසින් RDB බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බව ද කාරුණිකව දන්වා සිටිමි. තව ද නව නිපැයුම්කරුවන් 07 දෙනෙකුගේ ක්ෂේත්‍ර පරීක්ෂණයන් කොමිසම හා RDB බැංකුව එක්ව සිදු කර ඇත. | නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා ණය ලබා දීම. |
| (ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව පේටන්ට් බලපත්‍ර 40 ක් සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීමට අපේක්ෂා කර තිබුණද වර්ෂය තුල නව නිපැයුම්කරුවන් 04 දෙනෙකු පමණක් කොමිසම වෙත යොමුවී තිබුණි. | පේටන්ට් අයදුම් කිරීම වෙනුවෙන් අවශ්‍ය සහයන් ලබාදීම වෙනුවෙන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක 09 ක වැඩසටහන් 09 ක් ද, දැනුවත්කිරීමේ සම්මන්ත්‍රණ හා වැඩමුළු 04 ක් පාසල් 03 කදී හා එක් විශ්ව විද්‍යාලයකදී ද , මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විශ්වවිද්‍යාල 02 ක් සඳහා ද සිදුකර ඇත.<br>විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 8ක් සඳහා පේටන්ට් වැඩමුළු 02 ක් සිදුකර ඇත. | දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩසටහන් පේටන්ට් අයදුම් කරුවන් ඉලක්ක කර සිදුකර නොමැති බැවින් ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය තුළ එක් එක් උප ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගේ මූල්‍ය හා භෞතික ප්‍රගතියත්, එම ප්‍රගතීන්හි ප්‍රතිශතත් ඒ ඒ උප ක්‍රියාකාරකම ඉදිරියෙන් වෙන් වෙන් වශයෙන් පැහැදිලිව දැක්විය යුතු වුවත් එලෙස දක්වා නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් උප ක්‍රියාකාරකම් වෙන් වෙන්ව දැක්වීම සම්බන්ධයෙන් වූ ඔබගේ නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැසුම් ඔබගේ නිරීක්ෂණයට අනුකූලව සැකසීමට කටයුතු කරමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්මේ YIELD වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහන යන උප ක්‍රියාකාරකම් සඳහා අනුමත | ඔබ විසින් පෙන්වා දී ඇති උප ක්‍රියාකාරකම්වලට අදාලව අනුමැතිය ඉක්මවා දැරූ වියදම් සම්බන්ධයෙන් වූ නිරීක්ෂණය පිළිගනිමි. | අනුමත වියදම් සීමාව තුල වියදම් දැරිය යුතුය. |

| | | |
|---|---|---|
| කරන ලද ඇස්තමේන්තු මුදල පිළිවෙළින් රු.200,000 ක් හා 700,000 ක් වුවත් ඒ සඳහා දැරූ වියදම පිළිවෙලින් රු.1,367,222 ක් හා රු.2,518,093 ක් විය. එ් අනුව සීමාව ඉක්මවා පිළිවෙළින් රු. 1,167,222 ක් හා රු.1,818,093 ක් වියදම් දරා තිබුණි. එම ඉක්මවීම ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 584 ක් හා සියයට 260 ක් විය. | | |
| (ඇ) ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘති යටතේ ඇති ක්‍රියාකාරකම් වලින් රු.6,950,000 ක් වටිනා උප ක්‍රියාකාරකම් 05 ක් වර්ෂය තුළ සිදුකර නොතිබුණු අතර රු.19,950,000 ක් වටිනා උප ක්‍රියාකාරකම් 08 ක් අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා වී නොතිබුණි. | අදාල කටයුතු සිදුකර ගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් ද නිසි පරිදි කොමිසම වෙත නොලැබුණු අතර ඒ හේතුවෙන් අඛන්ඩව මාස ගණනාවක් පුරා ක්‍රියාත්මක වන මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් අතරමග නවතා තැබීමට ද සිදු විය. ඒ අනුව "සහසක් නිමැවුම්" - 2022 තරඟය අදාල වර්ෂය තුල සම්පූර්ණ කිරීමට නොහැකි වූ බවට ඔබ කල නිරීක්ෂණය පිලිගනිමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුය. |